ශ්‍රී ලංකා

ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

පාර්ලිමේන්තුව

# 1981 අංක 37 දරන මුදල් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1981 ජූනි මස 2 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

1981 ජූනි මස 05 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක

මිල : ශත 65 යි

තැපැල් ගාස්තුව : ශත 50 යි

# 1981 අංක 37 දරන මුදල් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1981 ජූනි මස 2 වන දින]

එල්. ඩී.—ඕ. 85/80.

**1963 අංක 11 දරන මුදල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1981 අංක 37 දරන මුදල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. *(ලුහුඬු නාමය.)*

2. 1980 අංක 29 දරන පනතින් අවසන් වරට සංශෝධිත (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1963 අංක 11 දරන මුදල් පනතේ 119 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එහි 119අ වන වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :— *(1963 අංක 11 දරන මුදල් පනතේ 119අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම.)*

*("හෝටල් සහ ආගන්තුක නිවාස ලියාපදිංචි නොකිරීමේ හේතුව නිසා ම පමණක්, ව්‍යාපාර පිරිවැටුම් බද්ද අය කර ගැනීම අවලංගු නොවිය යුතු බව.)*

119අ. (1) අදාළ නියමයන් ප්‍රකාර, හෝටලයක් හෝ ආගන්තුක නිවාසයක් හෝ පවත්වා ගෙන යාමේ ව්‍යාපාරය සම්බන්ධයෙන් 1975 නොවැම්බර් මස 5 වන දිනයෙන් ආරම්භ ව, මේ වගන්තිය ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයෙන් අවසන් වන යම් කාල සීමාවක් සඳහා ව්‍යාපාර පිරිවැටුම් බද්ද අයකර ගැනීමක් ඒ හෝටලය හෝ ආගන්තුක නිවාසය, 1966 අංක 10 දරන ලංකා සංචාරක මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද ලංකා සංචාරක මණ්ඩලයෙහි ලියාපදිංචි කරනු ලැබ නොතිබීමේ හේතුව නිසා ම පමණක්, අවලංගු නොවන බව සල කනු ලැබිය යුතුය.

(2) අදාළ නියමයක "ලංකා සංචාරක මණ්ඩලයෙහි ලියාපදිංචි කරනු ලැබූ හෝටලයක් හෝ ආගන්තුක නිවාසයක් පවත්වා ගෙන යාමේ ව්‍යාපාරය" සම්බන්ධයෙන් වූ සෑම සඳහනක් ම 1966 අංක 10 දරන ලංකා සංචාරක මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද ලංකා සංචාරක මණ්ඩලය විසින් අනුමත කරන ලද හෝටලයක් හෝ ආගන්තුක නිවාසයක් පවත්වාගෙන යාමේ ව්‍යාපාරය සම්බන්ධයෙන් වූ සඳහනක් ලෙස ඒ නියමයේ දින සිට සලකනු ලැබිය යුතු ය. තව ද, ඒ අනුව, ඒ නියමයේ දිනයෙන් ආරම්භව, මේ වගන්තිය ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයෙන් අවසන් වන යම් කාල සීමාවක් තුළ හෝටලයක් හෝ ආගන්තුක නිවාසයක් පවත්වා ගෙන යාමේ

2—ඒ 56455—11,775 (81/03)

ව්‍යාපාරය සම්බන්ධයෙන්, අදාළ නියමය ප්‍රකාර, ව්‍යාපාර පිරිවැටුම් බද්ද අය කර ගනු ලැබිය යුතු යම් තැනැත්තකු විසින්—

(අ) ඒ කාල සීමාව සඳහා, ඒ ව්‍යාපාරයේ පිරිවැටුම දක්වෙන වාර වාර්තාවක්, මේ වගන්තිය ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට දින තිහක් ඇතුළත සපයනු ලැබුවහොත්, ඔහු ප්‍රධාන ප්‍රඥප්තියේ 123 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියාකර ඇති ලෙස සලකනු ලැබිය යුතු ය ; තව ද

(ආ) ඒ ව්‍යාපාරය සම්බන්ධයෙන් 122 වන වගන්තිය යටතේ ව්‍යාපාර පිරිවැටුම් බද්දෙහි සම්පූර්ණ ප්‍රමාණය එකී දින තිහ ඇතුළත ගෙවනු ලැබුවහොත්, ඒ පිරිවැටුම් බද්ද ගෙවීම ඔහු විසින් පැහැර හරිනු නොලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය. තව ද ඒ බද්දෙහි සම්පූර්ණ ප්‍රමාණය ඉහත සඳහන් දින තිහ ඇතුළත ගෙවීම ඔහු විසින් පැහැර හරිනු ලැබූ අවස්ථාවක, ඒ මුදල ගෙවීම පැහැර හරිනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ගෙවීම පැහැර හරිනු ලැබූ ව්‍යාපාර පිරිවැටුම් බදු අයකර ගැනීම සම්බන්ධයෙන් වූ මේ පනතේ මේ කොටසෙහි විධිවිධාන ඒ මුදල අයකර ගැනීමෙහි ලා එපරිද්දෙන් ම අදාළ විය යුතු ය.

(3) යම් අධිකරණයක හෝ විනිශ්චයාධිකාරයක යම් අභියාචනයක්, නඩුවක්, ඉල්ලීමක් හෝ වෙනත් නඩු කටයුත්තක් (එම අභියාචනය, නඩුව, ඉල්ලීම හෝ නඩු කටයුත්ත මේ පනතෙහි මේ කොටස ක්‍රියාත්මකවීම ආරම්භවන්නා වූ දිනයට පෙර හෝ පසුව ඉදිරිපත් කර හෝ පවරා හෝ තිබුණද) විභාග කරනු ලබන අවස්ථාවේ දී, 119 වන වගන්තිය යටතේ වූ යම් අදාළ නියමයක වලංගු භාවය පිළිබඳව යම් ප්‍රශ්නයක් හෝ කරුණක් උද්ගත වුවහොත්, ඒ ප්‍රශ්නය හෝ කරුණ මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවලට අනුකූලව තීරණය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ "අදාළ නියමය" යන්නෙන් 119 වන වගන්තිය යටතේ සාදනු ලැබ—

(අ) 1975 නොවැම්බර් මස 5 වන දින අංක 118/12 දරන ගැසට් පත්‍රයෙහි ; හෝ

(ආ) 1977 නොවැම්බර් මස 15 වන දින අංක 291/9 දරන ගැසට් පත්‍රයෙහි හෝ

පළ කරන ලද නියමයක් අදහස් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 120 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. 1980 අංක 29 දරන පනතින් අන්තිම වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 120 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ (v) වන අනුඡේදය වෙනුවට පහත දැක්වෙන අලුත් අනුඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

"(v) යම් බැංකුවක විදේශීය ව්‍යවහාර මුදල් පිළිබඳ බැංකු කටයුතු ඒකකයේ කාර්ය මෙහෙයුම හේතු සාධක වන බැංකු ගනුදෙනුවලට අදාළ වනතාක් දුරට, ඒ බැංකුවේ ව්‍යාපාර කටයුතු :".

ප්‍රධාන ප්‍රඥප්තියේ 137අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 137 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය, ඒ ප්‍රඥප්තියේ 137අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය :—

"ගෙවීම්වලින් පිරිවැටුම බද්ද අඩු කිරීම.

137අ. (1) යම් ගිවිසුමක පාර්ශ්වකරුවකු විශයෙන් හෝ යම් ගිවිසුමක පාර්ශ්වකරුවකු වන වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන් හෝ ඒ ගිවිසුමට අනුව යම් ගෙවීමක් කරන සෑම තැනැත්තකුම විසින්, ඒ ගිවිසුම ඇති කර ගන්නා ලද්දේ මේ වගන්තිය ක්‍රියාත්මක වීමට පෙර වුවද නොවුවද අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන ඒ ගෙවීමෙහි ප්‍රතිශතයක් වන, අනු ප්‍රමාණයක ව්‍යාපාර පිරිවැටුම් බද්දක් ඒ ගෙවීමෙන් අඩු කර ගත යුතුය. එසේ අඩු කර ගනු ලැබූ බදු ප්‍රමාණය ඒ තැනැත්තා ගෙන් ජනරජයට අයවිය යුතු ණය මුදලක් වන අතර, එය නොපමාව ම අය කර ගත හැකි විය යුතු ය. එසේ නැතහොත් මේ පනතේ මේ කොටස යටතේ ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු යම් ව්‍යාපාර පිරිවැටුම් බද්දක් වේ නම් ඒ ව්‍යාපාර පිරිවැටුම් බද්දට අමතරව තක්සේරුකොට ඒ තැනැත්තාගෙන් අය කර ගනු ලැබිය හැකි ය :

එසේ වුව ද ඒ ගිවිසුම ඉටු කිරීම සඳහා ගෙවිය යුතු මුළු ප්‍රතිෂ්ඨාව රුපියල් ලක්ෂ පහක් නොඉක්මවන අවස්ථාවක, එවැනි කිසිදු අඩු කර ගැනීමක් නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව ව්‍යාපාර පිරිවැටුම් බද්ද අඩු කර ගන්නා යම් තැනැත්තකු විසින්—

(අ) ඒ අඩු කර ගැනීම කරන ලද්දේ යම් තැනැත්තකුගේ ගෙවීමෙන් ද ඒ තැනැත්තාට—

(i) ඒ ගෙවීමේ දළ මුදල් ප්‍රමාණය ;

(ii) එසේ අඩු කර ගන්නා ලද බද්දේ අනුප්‍රමාණය සහ මුදල් ප්‍රමාණය ;

(iii) නියත වශයෙන්ම ගෙවන ලද ශුද්ධ මුදල් ප්‍රමාණය

දැක්වෙන ප්‍රකාශයක් නිකුත් කළ යුතු ය ; තවද

(ආ) ඒ අඩු කර ගැනීම කරන ලද දින සිට දින හතක් ඇතුළත දී,—

(i) ඒ ගෙවීම කරන ලද්දේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තාගේ නම සහ ලිපිනය ;

(ii) ඒ ගෙවීමේ දළ මුදල් ප්‍රමාණය ;

(iii) එසේ අඩු කර ගන්නා ලද බද්දේ අනුප්‍රමාණය සහ මුදල් ප්‍රමාණය ; සහ

(iv) නියත වශයෙන්ම ගෙවන ලද ශුද්ධ මුදල් ප්‍රමාණය

දැක්වෙන ප්‍රකාශයක් ද සමග, එසේ අඩු කර ගන්නා ලද මුදල් ප්‍රමාණය කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවිය යුතු ය.

(3) (1) වන උපවගන්තියට අනුකූලව ව්‍යාපාර පිරිවැටුම් බද්ද අඩු කර ගැනීමට පාත්‍ර වූ මුදලක් යම් තැනැත්තකුගේ පිරිවැටුමට ඇතුළත් වන අවස්ථාවක දී, ඒ මුදලට අදාළව (2) වන උපවගන්තියට අනුකූලව නිකුත් කරන ලද ප්‍රකාශයක් ඔහු විසින් ඉදිරිපත් කළ විට, එසේ අඩු කර ගන්නා ලද බදු මුදල් ප්‍රමාණය වශයෙන් ඒ ප්‍රකාශයෙහි දක්වා ඇති මුදල් ප්‍රමාණය ඔහු විසින් ගෙවිය යුතු බද්දෙන් හිලව් කිරීමේ හිමිකම ඒ තැනැත්තාට ඇත්තේ ය.

(4) මේ වගන්තියේ කාර්ය සඳහා "ගිවිසුම" යන්නෙන්—

(i) කවර හෝ ස්වභාවයක වූ ඉදිකිරීම් වැඩ සම්බන්ධයෙන් වූ යම් ගිවිසුමක් ;

(ii) (i) වන ඡේදයේ සඳහන් යම් ගිවිසුමක් සම්බන්ධයෙන් භාණ්ඩ හෝ සේවා සැපයීම සඳහා යම් ගිවිසුමක් ; සහ

(iii) (i) වන හෝ (ii) වන ඡේදයේ සඳහන් යම් ගිවිසුමකට අදාළ අතුරු ගිවිසුමක්

අදහස් වේ.

(5) (1) වන උපවගන්තිය ප්‍රකාර ව්‍යාපාර පිරිවැටුම් බද්ද අඩු කර ගැනීම පැහැර හරින හෝ යම් පිරිවැටුම් බද්දක් (2) වන උපවගන්තිය ප්‍රකාර කොමසාරිස් ජනරාල්වරයා වෙත යැවීම පැහැර හරින හෝ යම් තැනැත්තකු පැහැර හැරි තැනැත්තකු ලෙස සලකනු ලැබිය යුතු අතර, ව්‍යාපාර පිරිවැටුම් බද්ද අයකර ගැනීමට අදාළ මේ පනතේ මේ කොටසේ විධිවිධාන ඒ අනුව එවැනි යම් පැහැර හැරීමක් සම්බන්ධයෙන් අදාළ කරනු ලැබිය යුතුය.

(6) (1) වන උපවගන්තිය යටතේ යම් අඩුකර ගැනීමක් කළා වූ හෝ (2) වන උපවගන්තිය යටතේ යම් ප්‍රේෂණයක් කළා වූ හෝ යම් තැනැත්තකු, ඒ බද්ද ගෙවිය යුතු තැනැත්තා ගෙන් සහ ඊට අදාළ අනෙක් සියලු තැනැත්තන් ගෙන් ලත් බලය යටතේ ක්‍රියා කළ ලෙස සලකනු ලැබිය යුතු අතර, වෙනත් යම් ලිඛිත නීතියක, ගිවිසුමක හෝ එකඟවීමක කවර විධිවිධානයක් තිබුණ ද අවස්ථාවෝචිත පරිදි, ඒ අඩුකර ගැනීම හෝ ප්‍රේෂණය හෝ සම්බන්ධයෙන් ඔහුට විරුද්ධ සියලු සිවිල් හෝ අපරාධ නඩු කටයුතුවලින් ඔහු මෙයින් ආරක්ෂා කරනු ලැබේ.

(7) යම් තැනැත්තකු විසින් ගිවිසුම් දෙකකට හෝ ඊට වැඩි ගණනකට ඇතුළත් වූ සහ ඒ ගිවිසුම් සම්බන්ධයෙන් ගෙවීම් කරන තැනැත්තා යන දෙදෙනාම එකම තැනැත්තා බව හෝ ඔහුගේ අනුයෝජිතයා බව ඒ ගිවිසුම්වල ස්වභාවය සහ පාර්ශ්වකරුවන් ද සැලකිල්ලට ගැනීමෙන් පසුව, තක්සේරුකරුගේ මතය වන අවස්ථාවක, ගෙවන ලද හෝ ගෙවිය යුතු මුදල් (1) වන උපවගන්තියේ කාර්ය සඳහා එකතු කරනු ලැබිය යුතු ය. ".

ප්‍රධාන පනතෙහි 159 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. 1978 අංක 26 දරන පනතින් අන්තිමවරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියෙහි 159 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "පිරිවැටුම" යන්නෙහි අර්ථකථනය වෙනුවට, පහත දැක්වෙන අලුත් අර්ථකථනය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය, මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

' "පිරිවැටුම" යන්න යම් ව්‍යාපාරයකට අදාළව යෙදෙන විට, ඒ ව්‍යාපාරය සම්බන්ධයෙන් ඇතුළත් වුණු ගනුදෙනුවලින් හෝ ඒ ව්‍යාපාරය පවත්වාගෙන යාමේ දී ඉටු කරන ලද සේවාවන් සඳහා හෝ ලැබුණා වූ නැතහොත් ලැබිය යුතු මුළු මුදල ඉන් අදහස් වන අතර, ඊට —

(අ) බැංකුවක් සම්බන්ධයෙන් වූ විට, පොලිය, වට්ටම්, ලාභාංශ, විනිමය, සේවා ගාස්තු, කොමිස් මුදල්, නැරවි ගාස්තු වශයෙන් හෝ සඳහා වූ ඒ බැංකුවේ ලැබීම් සහ එකී ව්‍යාපාරික කටයුතුවල දී හෝ අන්‍යාකාරයෙන් හෝ ඒ බැංකුව විසින් ලබා ගන්නා වෙනත් යම් ආදායමක් ඇතුළත් වන නමුත් ඒ බැංකුවේ විදේශීය ව්‍යවහාර මුදල් පිළිබඳ බැංකු කටයුතු ඒකකයේ කාර්ය මෙහෙයුම් හේතුකොට ගත් ඔවට සැලකිය හැකි ලැබීම් ඇතුළත් නොවිය යුතු ය.

මේ ඡේදයෙහි "විදේශීය ව්‍යවහාර මුදල් පිළිබඳ බැංකු කටයුතු ඒකකය" යන්නෙන් විදේශීය ව්‍යවහාර මුදල් පිළිබඳ බැංකු කටයුතු ඒකකයක් ලෙස ක්‍රියා කිරීමට ශ්‍රී ලංකාවේ මහ බැංකුව විසින් බලය දෙන ලද, වාණිජ බැංකුවක ඒකකයක් නැතහොත් දෙපාර්තමේන්තුවක් අදහස් වේ :

(ආ) ධනයෝජකයකු, මුදල් ණයට දෙන්නකු, නැතහොත් බඩු උකස් ගන්නකු සම්බන්ධයෙන් වූ විට, ණය වශයෙන් ඔහු විසින් බැහැර දෙන ලද මුදල්, ඒ ණය වෙනුවෙන් ඔහු විසින් ලබා ගන්නා ලද නැතහොත් ඔහුට ලැබිය යුතු පොලිය සහ ඒ ණය වෙනුවෙන් ගාස්තු හෝ වෙනත් අය කිරීම් හෝ වශයෙන් ඔහු විසින් ලබා ගන්නා ලද මුදල් ඇතුළත් විය යුතු ය :

(ඇ) වෙන්දේසිකරුවකු සම්බන්ධයෙන් වූ විට සහ (ඈ) ඡේදයෙහි විධිවිධානවලට යටත්ව, නැරවිකරුවකු නැතහොත් කොමිස් නියෝජිතයකු සම්බන්ධයෙන් වූ විට—

(i) ඔහු විසින් විකුණන ලද හෝ මිලදී ගැනීමෙහි ලා ඔහු උපකාරක වූ හෝ ඉඩම් සම්බන්ධයෙන් වූ විට ඒ විකිණීම සම්බන්ධයෙන් ඔහු විසින් සිදු කරන ලද ගනුදෙනු හෝ ඉටු කරන ලද සේවාවන් හෝ සඳහා ඔහු විසින් ලබාගන්නා ලද හෝ ඔහුට ලැබිය යුතු කොමිස් මුදල් හෝ ගාස්තු ;

(ii) ඔහු විසින් විකුණන ලද හෝ විකිණීමෙහි ලා ඔහු උපකාරක වූ භාණ්ඩ කිසිවක් සම්බන්ධයෙන් වූ විට ඒ භාණ්ඩ ගැනුම්කරු විසින් ගෙවන ලද හෝ ගෙවිනු ලැබිය යුතු මුළු මුදල

ඇතුළත් විය යුතු ය ;

(ඇ) (කොටස් තැරැව්කරුවකු හෝ භෝග තැරැව්කරුවකු නොවන) යම් තැරැව්කරුවකු හෝ කොමිස් නියෝජිතයකු හෝ සම්බන්ධයෙන් වූ විට, ඔහු—

(i) නේවාසික නොවන තැනැත්තකුගේ භාණ්ඩ කිසිවක් ඒ නේවාසික නොවන තැනැත්තා වෙනුවෙන් විකුණන්නා වූ හෝ විකිණීමෙහි ලා උපකාරක වන්නා වූ අවස්ථාවක ; හෝ

(ii) ශ්‍රී ලංකාවෙහි නිෂ්පාදිත යම් භාණ්ඩ අපනයනය කරන්නකු වෙනුවෙන් ක්‍රියා කරන අවස්ථාවක ; හෝ

(iii) ශ්‍රී ලංකාවෙහි ව්‍යාපාරයක් පවත්වා ගෙන යන්නා වූ වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන්, ඒ ව්‍යාපාරය 120 වන වගන්තියේ (3) වන උපවගන්තියෙහි "ව්‍යාපාරය" යන යෙදුමෙහි අර්ථානුකූල වූ ව්‍යාපාරයක් වුව ද නොවුව ද, විකිණීමෙන් ලැබෙන සම්පූර්ණ මුදල ඒ වෙනත් තැනැත්තාගේ ව්‍යාපාරයෙහි පිරිවැටුමට ඇතුළත් වන භාණ්ඩ වූ ඒ වෙනත් තැනැත්තාගේ භාණ්ඩ කිසිවක් ශ්‍රී ලංකාවෙහි දී විකිණීමෙහි ලා උපකාරක වන්නා වූ අවස්ථාවක

ඒ තැරැව්කරු හෝ කොමිස් නියෝජිතයා සම්බන්ධයෙන් වූ විට, එසේ විකිණීමෙහි ලා හෝ ක්‍රියා කිරීමෙහි ලා හෝ එසේ විකිණීමේ දී උපකාරකවීමේ ලා ඔහු විසින් සිදු කරන ලද ගනුදෙනු හෝ ඉටු කරන ලද සේවාවන් සම්බන්ධයෙන් ඒ තැරැව්කරු හෝ කොමිස් නියෝජිතයා විසින් ලබා ගන්නා ලද හෝ ඔහුට ලැබිය යුතු හෝ කොමිස් මුදල් හෝ ගාස්තු සහ කොටස් තැරැව්කරුවකු හෝ භෝග තැරැව්කරුවකු හෝ සම්බන්ධයෙන් වූ විට, ඔහු විසින් සිදු කරන ලද ගනුදෙනු හෝ ඉටු කරන ලද සේවාවන් සඳහා ඔහු විසින් ලබා ගන්නා ලද හෝ ඔහුට ලැබිය යුතු හෝ කොමිස් මුදල් හෝ ගාස්තු ඇතුළත් විය යුතු ය ; තව ද

(ඉ) යම් අධ්‍යාපනික ආයතනයක් හෝ පාසලක් පවත්වා ගෙන යන තැනැත්තකු සම්බන්ධයෙන් වූ විට, අධ්‍යාපනික ආයතනයේ හෝ පාසලේ මුදල් ආයෝජනය කිරීමෙන් ලබන ලාභ හැර, ඒ අධ්‍යාපනික ආයතනය හෝ පාසල පවත්වා ගෙන යාමෙන් ඔහු විසින් ලබාගන්නා ලද හෝ ඔහුට ලැබිය යුතු මුළු මුදල ඇතුළත් විය යුතු ය.

එහෙත් මේ පනතේ මේ කොටසෙහි අන්‍යාකාරයකින් ප්‍රකාශිතව ම සඳහන් කර ඇතහොත් මිස, ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලබා ගන්නා ලද හෝ ලැබිය යුතු හෝ යම් මුදලක් ඇතුළත් නොවිය යුතු ය.'.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.